# යුරෝපා ඉතිහාසය

# 7.1.5 ප්‍රංශ විප්ලවයේ වැදගත්කම



## ප්‍රංශ විප්ලවයේ වැදගත්කම

ප්‍රංශ විප්ලවයේ අවසානයත් සමග යුරෝපය තුළ විශාල වෙනස්කම් රාශියක් සිදුවෙනු දක්නට ලැබිණි. ඒ අතර පහත දැක්වෙන ඒවා වැදගත් වේ.

- යුරෝපය මධ්‍ය කාලීන වැඩවසම් ක්‍රමයේ සිට නූතන ක්‍රමයට අවතීර්ණ වීම.
- ප්‍රංශ ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයේ සිට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වෙත පරිවර්තනය වීම.
- ප්‍රංශ වැසියා අපේක්ෂා කළ නිදහස, සමානාත්තාවය වැනි මූලික මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශයට පත් වීම.
- මූලික අයිතිවාසිකම් පදනම් කර ගත් ලිබරල් වාදය, ජාතික වාදය, වැනි මතවාද සපුරා ගැනීම සඳහා යුරෝපය පුරා විවිධ රටවල විප්ලව රැසක් ඇති වීම.
- එම මතවාද පදනම් කරගෙන ඉතාලිය එක්සත් වීම. සහ ජර්මනිය එක්සත් වීම මගින් යුරෝපයේ ජාතික රාජ්‍ය පුළුල් වීම.

## 1795 දී ප්‍රංශයේ බිහිවූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව



රොබෙස්පියර්ගේ මරණින් පසුව මධ්‍යස්ථ මතධාරීහු ජාතික සම්මේලනයේ ප්‍රමුඛස්ථානයට පත් වූහ. 1795 වන විට ප්‍රංශයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර දීමට එම සම්මේලනය සමත් විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක බලය පස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයකට පැවරුණ අතර මණ්ඩල දෙකකින් සමන්විත ව්‍යවස්ථාදායකයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු විය. මෙම අලුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ පාක්ෂිකයන්ගේ කැරළි ගැසීමට පටන් ගත් විට හමුදාව යොදවා ඒවා මර්දනය කරන ලදි. එම කැරළි මැඩීමට යෙදු හමුදාවේ අණ දෙන නිලධාරියා වූ නැපෝලියන් බොනපාට් නැමැති කෞෂිකානු තරුණයා ඉතා පහසුවෙන් කැරලිකාර පිරිස් පලවා හැරීමට සමත් විය. අනතුරුව 1799 සිට 1815 දක්වා ප්‍රංශය පාලනය කරන ලද්දේ ඔහු විසිනි.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා. ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආශ්‍රිත ග්‍රන්ථ



1. ඉතිහාසය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 12 ශ්‍රේණිය ( නව )
   අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2. ලෝක ඉතිහාසය - බී. වී. රාවෝ
   අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

3. ඉතිහාසය 11 ශ්‍රේණිය පෙළ පොත
   අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

4. යුරෝපා ඉතිහාසය - ( ක්‍රි. ව. 1500 - 1950 දක්වා )
   අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ. ඩී. නිමල් මයා. ශාන්ත ජෝසප් බාලිකා මහ වි. කොළඹ 14

Copyright © www.e-thaksalawa.moe.gov.lk